සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# පෙරදිග සංගීතය

9 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියළු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.

01 බිලාවල් රාගයේ වාදි හා සංවාදි ස්වර දෙක පිළිවෙලින්

(i) ධ, ග වේ. (ii) ග, ධ වේ. (iii) ග, නි වේ. (iv) ප, සं වේ.

02 බිලාවල්, භූපාලි, කාෆී යන රාග පිළිබඳව පහත දී ඇති ප්‍රකාශ වලින් නිවැරදි කරුණු ඇතුළත් ප්‍රකාශය තෝරන්න.

(i) බිලාවල් හා කාෆී රාග දෙකේ යෙදෙන ස්වර සමාන වේ.

(ii) කාෆී හා භූපාලි රාග දෙකේ ස්වර දෙකක් විකෘති වේ.

(iii) බිලාවල් හා භූපාලි රාග දෙකේම ස්වර ශුද්ධ ස්වර වේ.

(iv) කාෆී, භූපාලි, බිලාවල් රාග තුනේම විවාදි ස්වර ගායනය වේ.

03 භූපාලි රාගයේ වර්ජිත ස්වර ගණන,

(i) එකකි. (ii) දෙකකි. (iii) තුනකි. (iv) හතරකි.

04 ආරෝහණයේ දී ස්වර පහක් ද, අවරෝහණයේ දී ස්වර හතක් ද යෙදෙන රාගයක ජාතිය හඳුන්වන්නේ,

(i) ඖඩව, ෂාඩව ලෙසය. (ii) ෂාඩව, සම්පූර්ණ ලෙසය.

(iii) ෂාඩව, ඖඩව ලෙසය. (iv) ඖඩව, සම්පූර්ණ ලෙසය.

05 CHORS'S (කෝඩ්ස්) සමග ගී තනුව වාදනය නොකරන සංගීත භාණ්ඩය වන්නේ මින් කුමක් ද?

(i) විදුලි ඕගනය (ii) එකෝඩියන් (iii) සර්පිනාව (iv) ගිටාරය

06 ඉපියා දෙකක් සහිත (DOUBLE REED) ශුෂිර වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(i) OBOE (ii) CLARINET (iii) TRUMPET (iv) FLUTE

07 මධ්‍යම භාවයෙන් ලියා ඇති ස්වර ප්‍රස්තාරයක සं (උච්ච ෂඩ්ජය) ෂඩ්ජ භාවයෙන් ලියනවිට ලැබෙන්නේ,

(i) කෝමල නිශාදයයි. (ii) පංචමයයි. (iii) මධ්‍ය ෂඩ්ජයයි. (iv) මධ්‍යමයයි.

08 බටහිර රේඛා මණ්ඩලයේ ස්වර ප්‍රස්තාරය කිරීමේ දී KEY SIGNATURE (කී සිග්නේචර්) යොදන්නේ නැති MAJOR SCALE එක (මේජර් ස්කේල්) වන්නේ කුමක් ද?

(i) C (ii) F (iii) G (iv) B♭

09 සාමාන්‍ය බොක්ස් ගිටාරයක තත් ගණන කීයද?

(i) 4 කි. (ii) 6 කි. (iii) 8 කි. (iv) 12 කි.

10 ඉන්දියානු චිත්‍රපට සංගීතයේත්, ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේත් ඉතා ජනප්‍රිය වූ ස්වර පුවරු භාණ්ඩය වන්නේ කුමක් ද?

(i) හාමෝනියම් (ii) පියානෝව (iii) විදුලි ඕගනය (iv) එකෝඩියන්

11 දරුනැලවිලි ගී නාද මාලාව ආශ්‍රිතව නිර්මාණය වී ඇති වික්ටර් රත්නායක මහතා විසින් ගයන මව් ගුණ ගීතයක් වන්නේ කුමන ගීතයද?

(i) සියක් ආයු ලැබ (ii) අම්මා සඳකි

(iii) ආදරයේ උල්පත වූ අම්මා (iv) දවසක් පැල නැති හේනේ

12 ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ නූර්ති නිෂ්පාදකයන්ගේ නම් සඳහන් පිළිතුර තෝරන්න.

(i) ජෝන් ද සිල්වා, එම්. ජී. පෙරේරා, චාර්ල්ස් ඩයස්

(ii) මැන්දිස් පෙරේරා, එම්. ජී. පෙරේරා, ඩබ්. සී. පෙරේරා

(iii) සී. දොන් බස්තියන්, පීටර් ද සිල්වා, ජෝන් ද සිල්වා

(iv) චාර්ල්ස් ඩයස්, ජෝන් ද සිල්වා, සී දොන් බස්තියන්

13 කාෆී රාගයේ අර්ධ දුර (Semitone) ඇති ස්වර දෙකක් වනුයේ,

(i) ගු ම ස්වරයේ ය. (ii) රි ගු ස්වරයේ ය. (iii) ම ප ස්වරයේ ය. (iv) නි ස් ස්වරයේ ය.

14 පංචතූර්ය භාණ්ඩ අතුරින් "බෙර පුහුල" නම් කොටස දැකිය හැකි වන්නේ කුමන බෙරයේ ද?

(i) උඩරට බෙරය (ii) පහතරට බෙරය (iii) දවුල (iv) තම්මැට්ටම

15 "ගුගුඳ, රෙගත, දූහිං" යන අක්ෂර වැයෙන බෙරය

(i) උඩරට බෙරයයි. (ii) පහතරට බෙරයයි. (iii) දවුලයි. (iv) තම්මැට්ටමයි.

16 විතත ඝනයට අයත් වන්නේ කුමන බෙරයද?

(i) දවුල (ii) තම්මැට්ටම (iii) උඩැක්කිය (iv) රබාන

17 කඩිප්පු ආධාරයෙන් වැයෙන බෙර අක්ෂරත්, අතින් වැයෙන බෙර අක්ෂරත් සඳහන් පිළිතුර කුමක් ද?

(i) දොම්කිට, දොං ජිං (ii) ගත් ගුඳ, ගජි ගත (iii) ජෙංගත්, කිටිතක (iv) රුංතක, ජිංතක

18 ඉතා සියුම් හමක් උපයෝගී කරගෙන ඇත්තේ,

(i) රබානට ය. (ii) තම්මැට්ටමට ය. (iii) දවුලට ය. (iv) පහතරට බෙරයට ය.

19 පහතරට වන්නමක දැකිය හැකි විශේෂිත කොටස කුමක් ද?

(i) තානම (ii) කස්තිරම (iii) ඉරට්ටිය (iv) කලාසම

20 හින්දුස්ථානි රාගාශ්‍රිතව නිර්මාණය වූ පේමතෝ ජායතී ශෝකෝ ගීත නාට්‍ය නිර්මාණකරුවා වන්නේ කවිද?

(i) බන්දුල ජයවර්ධන මයා (ii) ඩබ්. බී. මකුලොලුව මයා

(iii) එදිරිවීර සරච්චන්ද්‍ර මයා (iv) හෙන්රි ජයසේන මයා

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01 (i) පහත දී ඇති රාග විස්තර වගුව සම්පූර්ණ කරන්න.

හිස්තැනෙහි සඳහන් ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් අදාළ පිළිතුර ලියන්න. (ල. 06)

| රාගය | ආරෝහණ / අවරෝහණ | වාදී | සංවාදී | ගායන සමය | ප්‍රධාන ස්වර සංගති |
|---|---|---|---|---|---|
| භූපාලි | a. | b. | c. | රාත්‍රී ප්‍රථම | d. |
| e. | ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස්<br>ස් <u>නි</u> ධ ප ම <u>ග</u> රි ස | f. | ස් | g. | h. |
| i. | j. | ධ | k. | *l.* | ගප , ධනිස් |

(ii) ඉහත වගුවේ සඳහන් රාග වලින් එකක සර්ගම් ස්ථායි කොටස ප්‍රස්තාර කරන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

02 (i) යතුරු පුවරු සහිත සංගීත භාණ්ඩ හතරක් නම් කරන්න. (ල. 02)

(ii) $B^{\flat}$ MAJOR SCALE (බී ෆැලට් මේජර් ස්කේල්) යතුරු පුවරුව මත ලකුණු කරන්න. (ල. 02)

(iii) බිලාවල්, භූපාලි, කාෆි යන රාග තුනෙන් <u>දෙකක</u> ආරෝහණ මධ්‍යම භාවයෙන් හෝ පංචම භාවයෙන් ලියා දක්වන්න. (ල. 06)

(මුළු ලකුණු 10)

03 (i) සාමාන්‍ය බොක්ස් ගිටාරයක පර්ද පුවරුව මත (Box GUITAR FRET BOARD) ශුද්ධ ස්වර අෂ්ටකය ලකුණු කරන්න. (ල. 04)

(ii) ගිටාරයේ FRET BOARD මත පහත දී ඇති CHORDS (කෝඩ්ස්) වලින් දෙකක් ලකුණු කරන්න.

(a) C (b) D (c) $E^{minor}$ (d) G (c) A

(ල. 06)

(මුළු ලකුණු 10)

04 පහත දී ඇති බටහිර ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත ප්‍රස්තාරයේ අංක 1 සිට 8 දක්වා පෙන්නුම් කරන සංකේත නම් කරන්න. (ල. ½ x 8 = 04)

(ii) ඉහත ඔබ විසින් හඳුනාගත් සංකේත වලින් තුනක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 2 x 3 = 06)

(මුළු ලකුණු 10)

05 පහත දී ඇත්තේ නිර්දේශිත නව නාට්‍ය කීපයකි.

(a) නරිබෑනා (b) හුණුවටයේ කථාව (c) දෙපානෝ

(d) තාරාවෝ ඉගිලෙති (e) බෙරහඬ (f) නලදමයන්ති

(i) ඉහත සඳහන් නාට්‍ය අතරින් හතරක් පිළිබඳ ඒවායේ නාට්‍ය අධ්‍යක්ෂවරු සඳහන්කර, එහි ඇතුලත් ගීතය බැගින් නම් කරන්න. (ල. 04)

(ii) උකුසා වන්නම තානම මුල් පේළි දෙක ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ල. 06)

(මුළු ලකුණු 10)